# ගිනි තැබීමෙන් පසු...



**කපිල එම්. ගමගේ**

ඕනෑම සමාජයක සාමාජිකයින් තීරණ තීන්දුවලට එලඹෙන්නේ, තමන්ගේ දැනුම, අත්දැකීම, තමන් සතු තොරතුරු ප්‍රමාණය අනුව. ඒ නිසා තොරතුරු සම්පාදනයේදී නිරවද්‍යභාවය (Accuracy )යනු තීරණාත්මක සාධකයක්. එහිදී තොරතුරු මූලාශ්‍රය විශ්වසනීය (Credible ) එකැක්දැයි සොයා බැලිය යුතු වෙනවා. විධිමත් තොරතුරු ප්‍රවාහයන් සක්‍රියව ඇති සමාජයක තොරතුරු සම්පාදනය යම් මට්ටමකට ඉහළ තැනක තිබෙනවා. අවිධිමත් තොරතුරු ප්‍රවාහයන් වඩාත් සක්‍රිය වන්නේ විධිමත් තොරතුරු ප්‍රවාහයන්ගේ විශ්වසනීයත්වය බිඳවැටුන සමාජයක. එවැනි සමාජයක් ගනු ලබන තීරණ තීන්දු භයානක ප්‍රතිඵල අත්පත් කර දෙනවා.

ශ්‍රී ලංකා සමාජය තොරතුරු විසරණය හා ග්‍රහණය කරගැනීම අතින් අසමත් සමාජයක්. එහි තොරතුරු විසරණය දැඩි අගතිගාමී ස්වරූපයක් ගන්නවා සේම ග්‍රහණය කරගන්නා සමාජයද අත්තනෝමතිකයි. එම නිසා එම තොරතුරු මත පදනම්ව තීරණ වලට එළඹීම අති භයානක ප්‍රතිඵල සමාජයට අත්පත් කර දෙනවා. මේ සඳහා ඉතා හොඳ උදාහරණ දෙකක් මෑතකදී අපේ සමාජයේ විද්‍යමාන වුණා.

01. දියතලාවේ බස් රථයේ බෝම්බය පිපිරීම
02. අම්පාරේ මුස්ලිම් ආපනශාලාවක ආහාර වලට වඳ බෙහෙත් මුසු කිරීම.

මේ සිදුවීම් දෙකම අරභයා අපේ සමාජය තුල පැතිර ගිය තොරතුරු වල සාවද්‍යය බව මේ වනවිට සනාථ වෙමින් පවතිනවා. එහිදී සමාජ ජාලා තුල හා ගොසිප් වෙබ් අඩෙවි වල පමණක් නොවේ බහුජන මාධ්‍ය ලෙස සලකන රූපවාහිනී, ගුවන් විදුලි, පුවත්පත් පවා ඒවා වාර්තා කලේ අති අමනෝඥ ආකාරයට.

**මෙම සිද්ධීන් අරභයා බොහෝ දෙනෙකු ලියූ සත්‍ය තොරතුරු ඇඟිලි තුඩින් බැහැර කර සමාජය අසත්‍ය තොරතුරු සත්‍ය බව දිවුරා ප්‍රකාශ කර සිටියා. ඒ සමාජ සාමාජිකයින් අතර විශ්ව විද්‍යාල ඇදුරන්, සමාජය පිළිගත් පුද්ගලයින්, ජනමාධ්‍යකරුවන්, දේශපාලකයින්, ආගමික සංස්ථා නියෝජිතයින් පමණක් නොව ජනමාධ්‍ය ගුරුවරුන් පවා සිටීම ඛේදවාචකයක්.**

මේ නිසා සමාජය තුල ඇතිවුණ විනාසය සුලු කොට සලකන්න බෑ. එය හුදෙක් භෞතික විනාශයක් පමණක් නොවේ මානසික විනාශයක්. දැඩි සිවිල් විනාශයකට තුන් වතාවක් මුහුණ පා ඇති සමාජයක් තුල එම විනාශය පෙනෙනවාට වඩා බරපතල වෙන්නේ ගැඹුරකින්.

මෙම සිද්ධීන් අරභයා බොහෝ දෙනෙකු ලියූ සත්‍ය තොරතුරු ඇඟිලි තුඩින් බැහැර කර සමාජය අසත්‍ය තොරතුරු සත්‍ය බව දිවුරා ප්‍රකාශ කර සිටියා. ඒ සමාජ සාමාජිකයින් අතර විශ්ව විද්‍යාල ඇදුරන්, සමාජය පිළිගත් පුද්ගලයින්, ජනමාධ්‍යකරුවන්, දේශපාලකයින්, ආගමික සංස්ථා නියෝජිතයින් පමණක් නොව ජනමාධ්‍ය ගුරුවරුන් පවා සිටීම ඛේදවාචකයක්.

අපේ සමාජයට අවශ්‍ය වන්නේ සමාජය වඩාත් සාධනීය ලෙස ඉදිරියට තල්ලු කරන තොරතුරු සම්පාදනයක් විනා, සමාජය තව තවත් අගතිය වෙත තල්ලු කරන තොරතුරු සම්පාදනයක් නොවේ. මන්ද එවැනි තොරතුරු භාවිතයෙන් මේ සමාජය ඇතිතරම් බැට කා ඇති නිසයි. එවැනි තොරතුරු සම්පාදකයින් මෙන්ම, ඒවා මත පදනම්ව තීන්දු තීරන වලට එලැබෙන්නන් වැටෙන්නේ සිය වලිගය අවුලුවාගෙන රටම ගිනි තැබූ හනුමන්ගේ ජාන ප්‍රවර්ගයටයි. කන්නාඩියක් ඉදිරියට යන්න, එයද ඔබටම සනාථ කරගනු හැකිවෙනු ඇති.

